## කුකර්බිටේසියේ කුලයේ ශාක පත්‍ර කහ වීමේ තත්වය හා වෛරස් රෝග පාලනය

මේ සඳහා ඒකාබද්ධ පාලන ක්‍රමවේදයක් අවශ්‍ය වේ.

- වෛරස් රෝග කාරක ශාක රෝග වලින් කුඩා කලදී ඇතුවීම පාලනය කිරීම මගින් වෛරසයන්ගෙන් වන හානිය අවම කළ හැක. මේ සඳහා රෝග කාරක වෛරස් සහිත අවශේෂ කොටස් ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීමත් රෝගය සම්ප්‍රේෂණය වන ක්‍රම වලක්වා ගැනීමත් කල යුතු වේ.
- තවාන් පවත්වාගෙන යන්නේ නම් කෘමි ආවරණ දැල් යොදා ගැනීම
- වගා අවශේෂ ඉවත් කර ක්ෂේත්‍රය පිරිසදුව තබා ගැනීම
- ආසාදිත ශාක කොටස් ඉවත් කර විනාශ කර දැමීම
- නිරෝගී බීජ භාවිතය
- වර්ග මීටර 100 ට 1 බැගින් වන සේ පැල වලට අඩියකට පමණ ඉහළින් කහ පැහැති ඇලෙන උගුල් දැමීම
- රිකිලි කැඩීම, වැල් ගැට ගැසීම වැනි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුගමනයේදී, නිරෝගී පැල හැසිරවීමෙන් අනතුරුව පමණක් රෝගී පැල හැසිරවීම මගින්, දෑත් සහ උපකරණ මගින් රෝගී ශාක යුෂ සම්ප්‍රේෂණය වීම අවම කර ගැනීම
- ශාක සඳහා ප්‍රමාණවත් පරිදි කාබනික පොහොර භාවිතයත් නිසි පරිදි රසායනික පොහොර භාවිතයත් මගින් වෛරස් රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිකර ගැනීම.
- මනා ජල සම්පාදනය
- ක්ෂේත්‍රය වටා කෘමි බාධක වැටක් ලෙස බඩ ඉරිඟු වැනි බෝගයක් හෝ රිදී, සුදු හෝ අළු පැහැති පොලිතීන් යොදා ගැනීම
- වැසි රහිත කාලගුණයකදී වසුන් ලෙස කෘමි පරාවර්තක රිදී පැහැති පොලිතීන්, පිදුරු වැනි දෑ භාවිතා කිරීම
- කෘමි පළිබෝධකයින් පාලනය සඳහා කෘමිනාශක යොදා ගැනීම
- ඒකාබද්ධ පාලනයේදී, අවම ලෙස සහ අත්‍යාවශ්‍ය විටෙක පමණක් කෘමිනාශක භාවිතයත් මිනිසාට, අනෙකුත් ජීවීන්ට සහ පරිසරයට අඩු විෂභාවයක් පෙන්වන කෘමිනාශක භාවිතයත් සිදු කෙරේ.



## කෘමිනාශක භාවිතය

**බීජ ප්‍රතිකාරකය - :**

සිටුවීමට පෙර, බීජ කි.ග්‍රෑ. 10, තයාමෙතොක්සාම් 70- WS ග්‍රෑම් 10 යන අනුපාතයටජලය ස්වල්පයක්ද දමා බීජ සමග හොඳින් මිශ්‍ර කර දිනක් පමණ තබා සිටුවීම කරනු ලැබේ

වෛරස් රෝග වැළදෙන ක්ෂේත්‍රයක නම් පළිබෝධකයින්ගෙන් තොරව ක්ෂේත්‍රය පවත්වා ගත යුතු බැවින් කෘමිනාශක යෙදීම මුල් අවධියේ සිට සිදු කළ යුතුය.

**පැල වලට ප්‍රතිකාර කිරීම -:**

බීජ පැලකර දින 12කට පමණ පසු සුදුසු කෘමිනාශකයක් යෙදීම ආරම්භ කර වගාවේ මල් පිපෙන තුරු දින 10-14ට වරක් මාරුවෙන් මාරුවට යෙදිය හැක.

| කෘමිනාශක | ජලය ලීටර 10 ට | ජලය ලීටර 16 ට | හෙක්ටයට- | පාලනය වන කෘමීන්යට |
|---|---|---|---|---|
| ක්ලොරැන්ට්‍රානිලිප්‍රෝල් 20 % WG + තයාමෙතොක්සාම් 20 % WG | ග්‍රෑම්.2.5 | ග්‍රෑම්.4 | ග්‍රෑම්. 100-200 | සුදු මැස්සන් කුඩිත්තන් පැලමැක්කන් |
| බියුප්‍රොෆේසින් 10 % WP | ග්‍රෑම්.6 | ග්‍රෑම්.9.6 | - | සුදු මැස්සන්ගේ බිත්තර සහ වර්ධන අවධි |
| තයෝසයික්ලාම් 50 % SP | ග්‍රෑම්.25 | ග්‍රෑම්.40 | ග්‍රෑම්. 800-1500 | සුදු මැස්සන් කුඩිත්තන් පැලමැක්කන් |
| ෆිප්රොනිල් 5 % SC | මී.ලී.10 | මී.ලී.16 | මී.ලී. 320-600 | සුදු මැස්සන් කුඩිත්තන් පැලමැක්කන් |
| ඇබමෙක්ටින් 18 g/L EC | මී.ලී.6 | මී.ලී.10 | මී.ලී. 190-360 | මයිටාවන් පැලමැක්කන් |
| ඇබමෙක්ටින් 36 EW | මී.ලී.3 | මී.ලී.48 | – | මයිටාවන් පැලමැක්කන් |
| සල්ෆොක්සාෆ්ලෝර් 50% WG | ග්‍රෑම්.3 | ග්‍රෑම්.5 | ග්‍රෑම්.150 | සුදු මැස්සන් කුඩිත්තන් පැලමැක්කන් |
| පයිමෙට්‍රොසින් 50% WG | ග්‍රෑම්.3 | ග්‍රෑම්.5 | ග්‍රෑම්.150 | සුදු මැස්සන් කුඩිත්තන් පැලමැක්කන් |
| ප්‍රොෆෙනොෆොස් 50% EC | මී.ලී.20 | මී.ලී. 400 - 600 | | |


තාක්ෂණික උපදෙස්

ජීවනි මාරසිංහ - පර්යේෂණ නිලධාරිණි (කීට විද්‍යා අංශය)

විමසීම්

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව, පේරාදෙණිය.

පරිගණක සැකසුම

ඉන්දුකා නිශාන්ති නවරත්න - මී මැසි පාලිකා (කීට විද්‍යා අංශය)



මුද්‍රණය

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය. ගන්නෝරුව.


# කුකර්බිටේසියේ

## කුලයේ බෝගයන්හි වෛරස් රෝග සහ රෝග වාහකයින් පාලනය සඳහා ඒකාබද්ධ

# පළිබෝධ පාලනය




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2015

# කුකර්බිටේසියේ කුලයේ බෝගයන්හි වෛරස් රෝග සහ රෝග වාහකයින් පාලනය සඳහා ඒකාබද්ධ පළිබෝධ පාලන පැකේජය

පත්‍ර කහවීම, පත්‍ර විචිත්‍රය, කොළ කොඩවීම, පත්‍ර රෝල් වීම, පත්‍ර විකෘති වීම, වර්ධනය බාල වීම, පර්ව කෙටි වීම, පත්‍ර සෙව්වන්දියක් ඇති වීම ආදී රෝග ලක්ෂණ කුකර්බිටේසියේ කුලයේ බෝග වගා කිරීමේදී ඇතිවන ප්‍රධාන ගැටවකි.

මෙම රෝග ලක්ෂණ ඇතිවීමට ප්‍රධාන වශයෙන්, විවිධ වෛරස වර්ගයන්, කුඩිත්තන්, සුදු මැස්සන්, පැලමැක්කන්, කීඩෑවන් වැනි කෘමීන් හා මයිටාවන් විසින් ශාක වලින් යුෂ උරා බීමේදී සිදුවන සෘජු හානියත්, කෘමීන්ගේ බේටය සමග' ශාක තුළට ඇතුවන විවිධ විෂ සහිත රසායනික ද්‍රව්‍යයන් මගින් සිදුවන හානියත් බලපායි.

## වෛරස් රෝග හා පාලනය

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් සිදු කළ පර්යේෂණ මගින් මෙම බෝග වලට වැළඳෙන වෛරස් රෝග අතුරෙන් විවිධ වෛරස් වර්ග 6ක් ද බෙගමෝ කාණ්ඩයේ වෛරස් වර්ග ද ඇති බවට හදුනා ගන්නා ලදී.

1. **පිපිඤ්ඤා විචිත්‍ර වෛරස් රෝගය** (CMV)
2. **පැපොල් මුදු පුල්ලි වෛරස් රෝගය** (PRSV)
3. **දුම්කොළ මුදු පුල්ලි වෛරස් රෝගය** (TRSV)
4. **තක්කාලි මුදු පුල්ලි වෛරස් රෝගය** (ToRSV)
5. **පිපිඤ්ඤා කොළ පාට පුල්ලි විචිත්‍ර වෛරස් රෝගය** (CGMMV)
6. **සුකිනි කහ විචිත්‍ර වෛරස් රෝගය** (ZYMV)
7. **බෙගමෝ වෛරස් රෝග**





මෙම වෛරස් රෝග වෙන් වෙන්ව වර්ගීකරණය කළත් බොහෝ අවස්ථාවල කුකර්බිටේසියේ කුලයේ ශාක සඳහා වෛරස් වර්ග එකකට වැඩි ගණනක් ආසාදනය වී මිශ්‍ර ආසාදනයක් ලෙස දැකිය හැක. විවිධ වෛරස රෝග වල ව්‍යාප්තිය බෝග හා පාරිසරික තත්ත්ව මත වෙනස් විය හැක. එසේම මෙම වෛරස් රෝග විවිධ බෝග වලට වැළඳිය හැක.

මෙම වෛරස් රෝග අතුරෙන් බෙගමෝ වෛරස් බහුල ලෙස ව්‍යාප්ත වෙමින් පවතී. පොදු වශයෙන් ගත් කල, වෛරස් රෝගී ශාක වල පත්‍ර විචිත්‍රය, කොළ කොඩ වීම, පත්‍ර රෝල් වීම, කෙදි අකාර සිහින් වීම, කුරුවීම, සෙව්වන්දියක් ඇති වීම, පත්‍ර කහ වීම හා ඇතැම් විට තෙල් පැල්ලම් ආකාර සළකුණු ද දැකිය හැක.

පිපිඤ්ඤා විචිත්‍ර වෛරසය, පැපොල් මුදු පුල්ලි වෛරසය සහ සුකිනි කහ විචිත්‍ර වෛරස් වාහකයින් ලෙස කුඩිත්තන් ක්‍රියා කරන අතර වෛරස් රෝග සෑදුනු ගසක යුෂ යාන්ත්‍රික ක්‍රම මගින් සම්ප්‍රේෂණය වීම මගින් ද රෝගය ව්‍යාප්ත විය හැක. විවිධ කුල වල බෝග මෙම වෛරස මගින් ආසාදනය විය හැකි අතර ඇතැම් බෝග වල ආසාදිත බීජ මගින් ද රෝග කාරක ව්‍යාප්ත විය හැක.

පිපිඤ්ඤා කොළ පාට පුල්ලි විචිත්‍ර වෛරසය, ආසාදිත බීජ මගින් සහ යාන්ත්‍රික සම්ප්‍රේෂණය මගින් ව්‍යාප්ත වේ. දුම්කොළ මුදු පුල්ලි වෛරසය වටපනුවන් මගින්ද ඇතැම් විටෙක පැල මැක්කන්, මයිටාවන් සහ මැක්කන් මෙන් පෙනෙන කුඩා කුරුමිණියන් (fleas beetles) වැනි කෘමීන් මගින් ද සම්ප්‍රේෂණය විය හැකි බවට වාර්තා ඇත. තක්කාලි මුදු පුල්ලි වෛරස් රෝගය වටපනුවන්, යාන්ත්‍රික ක්‍රම හා ආසාදිත බිජ මගින් ව්‍යාප්ත විය හැක. බෙගමෝ වෛරස් රෝග සුදු මැස්සා මගින් සංක්‍රමණය වේ.

**8. මයිටා හානිය**

මයිටාවන් පත්‍ර යුෂ උරා බීම නිසා පත්‍ර මත සුදු පුල්ලි වැනි ස්වභාවයක් ඇතිවේ පත්‍ර දුඹුරු පැහැ වී මැරී යාම, පැල වැඩීම බාලවීම සිදුවේ.

